# අනුන් දුන් ආහාරයෙන් යැපෙන සිල්වත් භික්මුණු බ්‍රහ්මචාරීන්ට සුදුසු කල්හි කැඳ පූජා කර දෙව් මිනිස් සැප ලබන්න

## භේසජ්ජක්ඛන්ධකය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, විනය පිටකය, මහාවග්ගපාළි 2 - පිටු අංක 562 - 565)

කැඳ පානය කිරීමෙහි ආනිසංස දසයක් වෙයි.

කවර දහයක් ද යත්;

1. ආයුෂය ලැබෙන්නේ වෙයි.
2. වර්ණය ලැබෙන්නේ වෙයි.
3. සැපය ලැබෙන්නේ වෙයි.
4. බලය ලැබෙන්නේ වෙයි.
5. ප්‍රඥාව ලැබෙන්නේ වෙයි.
6. පානය කළ කැඳ බඩගිනි නසයි.
7. පිපාසාව දුරු කරයි.
8. කුසෙහි වූ වාතය සුදුසු තත්වයට පත් කරයි.
9. මල මූත්‍ර පහවීම පහසු කරයි.
10. ආමාශයෙහි නොපැසී ඉතිරි වූ ආහාර පැසවයි.

යමෙක් සිල්වත්, භික්මුණු, බ්‍රහ්මචාරීන්ට සුදුසු කල්හි කැඳ පූජා කිරීමෙන් මේ ආනිසංස දහය සිල්වත්, භික්මුණු, බ්‍රහ්මචාරීන්ට ලබා

දෙති. බුදු රජාණන් වහන්සේ විසින් වර්ණනා කළ බෙහෙතක් වන කැඳ පානය කරන බ්‍රහ්මචාරීන්ට මෙය ලැබෙයි.

කැඳ පූජා කළ තැනැත්තාට අනුන් විසින් දුන් ආහාරයෙන් යැපෙන බ්‍රහ්මචාරීන් වෙත කැඳ පූජා කිරීමෙහි විපාකය වශයෙන් දිව්‍යමය හෝ මනුෂ්‍යමය සැප සම්පත් ලැබෙන්නේය. එබැවින් දෙව් මිනිස් සැප කැමති යමෙකු වේ නම් ඔවුන් විසින් නිරතුරු කැඳ දන් දීම සුදුසු වෙයි.